07. වයඹ පාසලක, ආදි වාණිජ සිසුන් 50 දෙනෙකුගෙන් වාණිජ සංගමයක් 2017.04.01 දින ආරම්භ කරන ලදී. එම සංගමයට අදාල තොරතුරු පහත වේ.

i). එක් සාමාජිකයෙකුගේ ඇතුලත් වීමේ ගාස්තුව රු. 2000 ක් වූ අතර, එය ලද වර්ෂයේ ආදායම ලෙස හඳුනාගනී මාසික සාමාජික මුදල් රු. 500 ක් විය.
2017.10.01 දින සිසුන් 20 දෙනෙකු නව සාමාජිකයින් ලෙස බඳවා ගන්නා ලදී.

ii). සාමාජිකයින් 10 දෙනෙකු මාස තුනක සාමාජික මුදල් නොගෙවා තිබූ අතර, සාමාජිකයින් 15 දෙනෙකු ඉදිරි වර්ෂයේ මාස දෙකක සාමාජික මුදල් ගෙවා තිබුණි.

iii). 2018.03.31 පළමු සංවත්සර උත්සවය පවත්වන ලදී
එයට අදාළ තොරතුරු පහත වේ.

| | (රු.) |
|---|---|
| සමරු කලාප මුද්‍රණයට ගෙවූ මුදල් | 20,000 |
| සමරු කලාප මුද්‍රණයට ගෙවිය යුතු මුදල | 5000 |
| සංග්‍රහ වියදම් | 70,000 |
| වේදිකා සැරසිලි වියදම් | 8,000 |
| සුබ පතන්නන්ගෙන් ලද මුදල් | 50,000 |
| ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් | 4000 |

iv). 2018.10.01 දින රු. 120,000 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් මිලදී ගන්නා ලද අතර, එහි ඵලදායි ජීවකාලය වසර 4 ක් බවට ඇස්තමේන්තු කරන ලදී.

v). පුස්තකාල අරමුදලක් ඇති කිරීම සඳහා පාගමනක් සංවිධානය කරන ලද අතර, ඉන් ලද මුදල රු. 800,000 කි. එම මුදල් භාවිතයෙන් පුස්තකාල ගොඩනැගිල්ල 2018.03.31 දින වන විට සාදා නිම කරන ලදී.

vi). වර්ෂය තුළ ඉතිරි ලිපි ද්‍රව්‍ය රු. 1200 කි.

vii). රු. 100,000 ක් ස්ථාවර තැන්පත් ආයෝජනය කරන ලදී.

අවශ්‍ය වන්නේ,

1). 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම
2) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
3) 2018.03.31 දිනට වාණිජ සංගමයේ සමුච්චිත අරමුදල (ලකුණු 15)

❊ ❊ ❊

www.artsapi.lk